3943 (6)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2014
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 09 | විෂයය / பாடம் / Subject: භූගෝල විද්‍යාව | පත්‍රය / வினாத்தாள் / Paper: I,II | කාලය / காலம் / Time: පැය 02 |

නම :- ................................................ විභාග අංකය :- ..............................

සැලකිය යුතුයි:
- දී ඇති උපදෙස් පිළිපදිමින් පළමු කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

## I කොටස

- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) පෘථිවියේ 'පතන ශීඝ්‍රතාව' සිදුවන වායු ගෝලීය ස්තරය වන්නේ,
(1) අපරවර්තී ගෝලය (2) පරිවර්ති ගෝලය
(3) මෙසෝ ගෝලය (4) තාප ගෝලය

(02) ආසියාතු කලාපයේ මානව වර්ග දෙකෙන් මොංගොලයිඩ් මානවයින් ජීවත්වන රටක් වන්නේ,
(1) චීනය (2) ඉන්දියාව (3) අරාබිය (4) ඇෆ්ගනිස්ථානය

(03) දකුණු ආසියාතු සහයෝගීතා සංවිධානය හෙවත් 'සාර්ක්' සංවිධානයට අයත් නොවන රටකි.
(1) ඉන්දියාව (2) භූතානය (3) ඇෆ්ගනිස්ථානය (4) මැලේසියාව

(04) ශ්‍රී ලංකාවේ උතුරු පළාතට අයත් දිස්ත්‍රික්ක සංඛ්‍යාව වනුයේ,
(1) 06 (2) 04 (3) 5 (4) 3

(05) මහවැලි ගඟ ආශ්‍රිත ඉදිරිකාලයේ දී ජල විදුලි බල උත්පාදනය ඇතුළු සංවර්ධන කටයුතු සඳහා යොදා ගැනීමට අපේක්ෂිත අතු ගංගාව වන්නේ,
(1) දඹුළු ඔය (2) බදුලු ඔය (3) උමා ඔය (3) ලොග්ගල් ඔය

- අංක 6 සිට 10 දක්වා දී ඇති වගන්ති කියවා නිවැරදි නම් "✓" ලකුණ ද වැරදි "✗" ලකුණ ද ඉදිරියේ ඇති වරහන් තුළ යොදන්න.

(06) ඕසෝන් වියන ආරක්ෂා කර ගැනීම සඳහා '1987 මොන්ට්‍රියෙල් සම්මුතිය' ඇති කර ගන්නා ලදි. (.........)

(07) ලෝක උරුම අතර අස්පර්ශ උරුමයක් ලෙස "ටජ්මහල" සැලකිය හැක. (.........)

145

(08) ශ්‍රී ලංකාවේ වැඩිම විදුලිබල ධාරිතාවක් නිෂ්පාදනය කරනු ලබන ජලාශය ලෙස රන්දෙනිගල වැදගත් වේ. (.........)

(09) දකුණු ප්‍රදේශයේ බලාපොරොත්තු ඉලක්ක සපුරා දීමට නොහැකි වූ ව්‍යාපාරයක් ලෙස 'නිල්වලා ව්‍යාපාරය' සැලකේ. (.........)

(10) ශ්‍රී ලංකාවේ 1:50000 භූ ලක්ෂණ සිතියම් 92ක් නිර්මාණය කර ඇත. (.........)

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර යොදා හිස්තැන් පුරවන්න.

(11) පතන ශීඝ්‍රතා ක්‍රියාවලිය තුල උන්නතාංශය අනුව සෑම මීටර 100කටම සෙල්සියස් අංශක ...................................................... බැගින් උෂ්ණත්වය අඩු වේ.

(12) පෘථිවිය ජලයෙන් පිරුණු ග්‍රහලෝකයක් වුවත් මිනිසාගේ ප්‍රයෝජනයට ගත හැකි ජල ප්‍රමාණය ඇත්තේ සියයට ...................................................... පමණි.

(13) 'චීනයේ අඳෝනාව' හෙවත් 'ශෝකය' නමින් හඳුන්වන්නේ ...................................................... ගංගාවයි.

(14) උතුරු ප්‍රදේශයේ සංවර්ධනය සඳහා ශ්‍රී ලංකා රජය ...................................................... නම් වැඩසටහන ආරම්භ කර තිබේ.

(15) තෙත් බිම් සංරක්ෂණය සඳහා 1971 දී ...................................................... සම්මුතිය පිහිටුවා ගන්නා ලදී.

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්න වලට 'A' කොටසේ ඇති ප්‍රකාශයන්ට ගැළපෙන ප්‍රකාශ 'B' කොටසින් තෝරා ඊට අදාල අක්ෂරය වරහන තුළ ලියන්න.

| | | | |
|---|---|---|---|
| (16) උතුරු ආසියාව | (............) | A | යුප්‍රටීස්, ටයිග්‍රිස් |
| (17) නැගෙනහිර ආසියාව | (............) | B | ඉරවඩි |
| (18) මධ්‍යම ආසියාව | (............) | C | සයිබීරියා තැන්න |
| (19) ගිනිකොණ ආසියාව | (............) | D | තායිවානය |
| (20) නිරිතදිග ආසියාව | (............) | E | මොංගෝලියාව |

(ලකුණු 2 × 20 = 40)

## III කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.
- පිළිතුරු සැපයිය යුතු ප්‍රශ්න සංඛ්‍යාව පහකි.

(01) පාසල පදනම් කරගත් ඇගයීම යටතේ තුන්වන වාර අවසානයේ 9 ශ්‍රේණියේ භූගෝල විද්‍යාව විෂය සඳහා කරන ලද බිත්ති පුවත්පත ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) ඔබ හෝ ඔබ කණ්ඩායමට ලැබුණු ප්‍රධාන මාතෘකාව සඳහන් කරන්න. (ලකුණු 02)

(2) එම මාතෘකාව පදනම් කරගෙන තොරතුරු ගොනු කරන ලද අනු මාතෘකා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(3) මෙම ක්‍රියාකාරකම සඳහා ගුරුතුමිය/ගුරුතුමාගෙන් ලැබුණු උපදෙස් දෙකක් ලියන්න. (ලකුණු 02)

(4) බිත්ති පුවත්පත සඳහා තොරතුරු සපයාගත් මූලාශ්‍ර තුනක් ලියන්න. (ලකුණු 03)

(5) මෙම ක්‍රියාකාරකමේදී ඔබට අත් විඳීමට සිදු වූ ගැටලු දෙකක් ලියන්න. (ලකුණු 02)

(6) ක්‍රියාකාරකම සඳහා ඔබට අන් අයගෙන් ලැබුණ සහයෝගය පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 03)

(7) බිත්ති පුවත්පත සකස් කිරීමෙන් ඔබට ලැබුණු ප්‍රයෝජන දෙකක් ලියන්න. (ලකුණු 02)

(02) (1) පෘථිවියට ආසන්නයෙන්ම පිහිටි ග්‍රහලෝක දෙක නම් කරන්න. (ලකුණු 02)

(2) සෞරග්‍රහ මණ්ඩලය තුල පෘථිවියේ පිහිටීම අනුව සුවිශේෂී වී ඇත. වාසභූමියක් වශයෙන් පෘථිවියේ වැදගත්කම පිළිබඳව කරුණු 4ක් ලියන්න. (ලකුණු 04)

(3) අ. ජලය හිඟ වීම නිසා ඇතිවිය හැකි ගැටළු තුනක් සඳහන් කරන්න.
ආ. ජලය සංරක්ෂණය කරගත හැකි ආකාරය පිළිබඳ කෙටි විස්තරයක් ලියන්න. (ලකුණු 05)

(03) (1) ආසියානු කලාපය අවට පිහිටි මුහුදු හා විල් එක බැගින් ලියන්න. (ලකුණු 02)

(2) ආසියානු කලාපය තුල පිහිටි විල් හා මුහුදු මඟින් මිනිසුන්ට ඇති ප්‍රයෝජන හතරක් ලියන්න. (ලකුණු 04)

(3) අ. ආසියානු කලාපයේ පිහිටි වනාන්තර වර්ග දෙකක් ලියන්න.
ආ. වනාන්තරවලින් මිනිසාට ඇති ප්‍රයෝජන දෙකක් විස්තර කරන්න. (ලකුණු 05)

(04) (1) ආසියානු කලාපයේ දැකිය හැකි ප්‍රධාන කර්මාන්ත දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(2) ආසියානු කලාපයේ 'මකරුන් හතර දෙනා' යන විරුදාවලිය ලත් රටවල් 4 නම් කරන්න. (ලකුණු 04)

(3) අ. ආසියානු කලාපයේ ජනතාව මුහුණ දෙන අභියෝග දෙකක් ලියන්න.
ආ. ඒවා අවම කර ගැනීම සඳහා පිහිටුවා ඇති සංවිධාන දෙකක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(05) (1) කොළඹ පුරවර ප්‍රදේශයේ උතුරට හා දකුණට මායිම් වන ගංගා දෙක නම් කරන්න. (ලකුණු 02)

(2) දකුණු ප්‍රදේශය සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක කිරීමේ දී මතු වූ ගැටලු 4ක් සඳහන් කරන්න. (ලකුණු 04)

(3) 'නැගෙනහිර නවෝදය' වැඩ සටහන තුලින් නැගෙනහිර ප්‍රදේශය සංවර්ධනය කෙරෙන අයුරු උදාහරණ 2ක් ඇසුරින් විස්තර කරන්න. (ලකුණු 05)

(06) (1) මිනිසා පරිසරය ප්‍රයෝජනයට ගත් ආකාරය යුගයෙන් යුගයට වෙනස් විය. මෙම ක්‍රියාවලියේ කැපී පෙනෙන විකාශන අවස්ථා දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(2) වර්තමානය වන විට ලෝකයේ පැන නැගී තිබෙන පාරිසරික ගැටලු 4ක් ලියා දක්වන්න. (ලකුණු 04)

(3) තිරසාර සංවර්ධනය උදෙසා පිහිටුවාගෙන ඇති ගිවිසුම්, අණ පනත් හා සම්මුතීන් දෙකක් පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 05)

(07) ඔබ උගත් 1:50000 භූගෝල විද්‍යාත්මක සිතියම් ඇසුරින් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) 1:50000 සිතියම් සඳහා සුදුසු රේඛීය පරිමාණය ඇඳ දක්වන්න. (ලකුණු 02)

(2) සිතියම් විද්‍යාත්මක ක්‍රම අනුව පහත සඳහන් ස්ථාන සම්මත සංකේත හා ඊට අදාල වර්ණ ද භාවිතා කරමින් ඇඳ දක්වන්න.

a - පාසල

b - ප්‍රදීපාගාරය

c - තැපැල් කාර්යාලය (ලකුණු 04)

(3) ඔබ කැමති භූ විෂමතා ලක්ෂණ 3ක් නම් කර ඉන් එකක් පැහැදිලි කරන්න. (ලකුණු 05)

148